# ලංකාවිත්ති
# LANKA VITHTHI


මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුම්ය!
Mother and Motherland are nobler than Heaven



FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි
VOLUME 12
NUMBER 03

ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

MAY/JULY 10, 2009 ජූලි මාසය (බුද්ධ වර්ෂ 2553 ඇසළ මාසය)




**Photograph - Hans Rudolf Uthoff**
*Sugar - cane cutter in Sri Lanka* උක්ගස් කපන ගැටයා

# බෙදුම් වාදයට යළි ඉඩ නොදෙන්

♦ සංජය විමලරත්න විසිනි

දශක තුනක පමණ කාලයක් ජනතාවක් පෙලූ විෂම බෙදුම්වාදී ත්‍රස්තයින් විනාශකොට ශ්‍රීලංකා ජනතාව ලත් විශිෂ්ඨ ජයග්‍රහණයට පසු රටේ ඉදිරි ගමන දැන් අරඹා ඇත. රටේ සකල ජනතාවම මේ ත්‍රස්තවාදීන්ට එරෙහි සටනෙහි එකා මෙන් එකමුතුව යෙදුනාහ. ජය ලැබීමේ ප්‍රධාන සාධකය වූයේ ද ඒ එකමුතුවයි. රණවිරුවන් ප්‍රධාන ජනතාව දිවි පුදමින්, විවිධ දුක්ගැහැට විඳිමින් කළ පරිත්‍යාග තුළින් අප ලැබූ වටිනාම මාණික්‍යයද ඒ එකමුතුකම වෙයි. මේ මාණික්‍ය ආරක්ෂා කරගැන්ම අනිවාර්යයෙන්ම ඉදිරියට රට හැදීමේ මූලික පදනම විය යුතු ය.

## ත්‍රස්තවාදින් දමාගිය කුණුගොඩ

ප්‍රභාකරන් ප්‍රමුඛ දෙමළ කොටි ත්‍රස්තවාදීන් රළ විසින් භීෂණයෙන් මුසපත් කොට මිනිස් පළිහක් ලෙස ඉදිරියට තල්ලුකරගෙන ආ ලක්ෂ තුනකට ආසන්න දෙමළ ජන සමූහය මුදාගැනීමෙන් පසු ඒ අය නැවත ප්‍රකෘති ජීවන රටාවට යොමුකරලීම අද අප රටේ ප්‍රමුඛතාව ලැබ ඇති කාර්‍යභාරයයි. වසර ගණනාවක් කොටින් යටතේ එම ජනතාව දුක්වින්දාහ. යුද්ධයේ අවසාන අවස්ථා වේදීද අව සන් මොහොතේ හෝ නෝර්වේ ප්‍රමුඛ බටහිර හිතවතුන් කෙසේ හෝ පැමිණ තමන් බේරාගනීවි යැයි සිතූ ත්‍රස්තනායක රළ යුද්ධයේ අවසානය එතෙක් ප්‍රමාද කරගැන්මට මෙම දෙමළ ජනතා වගේ ජීවිත තුට්ටුවක් නොවටිනා කුණුකන්දරාවක් ලෙස භාවිතා කළ අකාරය අපි දනිමු.

නමුත් උන් මෙන් නොව අපි ශිෂ්ඨ සම්පන්න ජාතියක් වෙමු. පරාජයට මුහුණ දෙමින් පසුබසින අතර දිගින් දිගටම උන් වැළලූ බිම්බෝම්බ අජීවී කොට අස්කරලීම, මං මාවත්, ජල පහසුකම්, විදුලිය ආදී අන්තර් ව්‍යුහයන් දිස්ත්‍රික්ක තුනක් තුළ නැවත ප්‍රකෘතිමත් කරලීම සහ එම ජනතාව නැවත සිය ගෙවල් දොරවල්වල පදිංචි කරවා ජීවනෝපාය මාර්ග සෞඛ්‍යය අධ්‍යාපනය ආදී පහසුකම් සලසාලීම ආදිය මගින් උන් ඒ ඇති කරලූ කුණුගොඩ සුද්ධකිරීම මේ දැවැන්ත කාර්‍ය වෙයි. ඒ අතර තුරම මේ විශාල අවතැන් ජන කණ්ඩායමට එදි-නෙදා පැවැත්මට අවශ්‍ය ආහාර පානා දිය සහ ආරක්ෂාව සැපයීමද දිගින් දිගටම කළ යුතුව ඇත.

## වරද කාගේද?

එක්සත් ජාතීන්ගේ සංවිධානය, ජපානය, චීනය, ඉන්දියාව සහ තවත් බටහිර රටවලින්ද මේ සඳහා තරමක් සහනාධාර ලැබී ඇත. නමුත් මේ කටයුතු ඉටුකරලීමේ වැඩිම බර පැටවී ඇත්තේ අප රජය, හමුදාව ප්‍රමුඛ සේවා අංශ සහ ජනතාව මතය. නමුත් යුද්ධයෙන් පරාජය කරලන තුරුම කොටි ත්‍රස්තයන්ට සහාය දෙමින් අප රජයට හා හමුදාවට එරෙහිව කෙනෙහිලිකම් වල යෙදුණු බටහිර මාධ්‍යකාරයින් දැන් මේ කටයුතු හරියට නොකෙරෙන බවක් පෙන්වාලීමට ප්‍රයත්න දරති. ඇල්ජසීරා නමැති අද බටහිර මාධ්‍යගැත්තන්ගේ ග්‍රහණයට පත්ව ඇති ප්‍රවෘත්ති සේවාව මේ ළඟදී ප්‍රචාරය කළ අමූලික බොරු වලින් පිරි වැඩසටහනක් මගින් උත්සාහ කළේ මේ සියල්ලේ වරද අප රජය මත පැටවීමටය.

යුද්ධය උග්‍රවූ සමයේ ශ්‍රීලංකාවේ කටයුතුවලට අතදමා උන්ගේ හොඳද බොරකරගන්නටත්, ත්‍රස්තවාදීන්ට අනියමින් සහාය දෙන්නටත් අප රට ඉඩනොදීම ගැන මුන්ගේ ඇති තරහ පිර-මහගන්නට බොරුප්‍රචාර මගින් මුන් අදත් මාන බලති. සරණාගත තත්වයන් ඇතිවීමේ වරද අප රජය පිට පැටවීමට ප්‍රයත්න දරති. අමාරුවෙන් අප කරන මානුෂික මෙහෙවර එක්සත් ජාතීන්ගේ ලේකම් ප්‍රධාන අපට ආධාර දෙන රටවල ප්‍රභූන් ශ්‍රීලංකාවට ගොස් එහි තත්වය දැක රජයේ ක්‍රියාදාමය අගය කොට කරන ප්‍රකාශයන්ට මුන් බිහිරන් සේ හැසිරෙති.

අප රජය හෝ ජනතාව කවර විටෙකවත් යුද්ධයක් ඉල්ලුවේ නැත. දිගටම ප්‍රයත්නය වූයේ සාමය ගෙන ඒමයි. දිගින් දිගටම ඒවා කඩාක-ප්පල් කරමින් යුද්ධය කරා රට ඇදගෙන ගියේ ප්‍රභාකරන් ප්‍රමුඛ ත්‍රස්තවාදී රළයි.

කණගාටුවට කරුණක් නම් අප රටේ සමහර අයටද ඉතා ඉක්මනින් මෙම සත්‍යය අමතක වී තිබීමයි. සෑම විටම අප රජය ප්‍රති උත්තර දීමේ දී මේ තත්වයන්ට මුළුමනින්ුත් සාධාරණ වශයෙනුත් ගත් කළ සම්පූර්ණ වරද ඒ ත්‍රස්ත රළ සහ උන්ට උල්පන්දම් දුන් බටහිර මාධ්‍ය දේශපාලකයින් ඇතුළු බලවේග බව පැහැදිලිව පෙන්වා දිය යුතුය.

## උතුරු වසන්තය ප්‍රධාන ඉදිරි මග

ඉහත සඳහන් කළ කඩිනම් කාර්‍යයන් සමගම සහ එයට පසු රජය සහ ජනතාව ඉදිරියේ ඇත්තේ යෝජිත උතුරු වසන්තය ප්‍රධාන ඉදිරි මග ඔස්සේ යෑමයි. දශක තුනක් පමණ කුරිරු ත්‍රස්ත පාලනයට යටවී දුක් වින්ද මේ ජනතාවට සුඛිත මුදිත ජීවිත ලබාදීම සඳහා පදනම දැමීම එහි මූලික අරමුණ වෙයි. ත්‍රස්ත බාධක මධ්‍යයේ වුවද හැකි සෑම ආකාරයෙන්ම මුළු කාලය තුළම ජල, වාරි, මූලික ආහාර අවශ්‍යතා, සෞඛ්‍යය හා අධ්‍යාපනය ආදී පහසුකම් නොකඩවා සපයන ලද්දේ රජය විසිනි. කොටි ත්‍රස්තයින් විසින් නොවේ. උන් මෙතක් කර ඇත්තේ ආයුධ රැස්කිරීම බව යුද්ධයට පසු එළිවූ ආයුධ ගබඩා සාක්ෂි වෙති.

රජය මේ ජනතාවටද සිය රටවැසියන් වශයෙන් නොකඩවා සැලකීය. ඉදිරියේදී කෘෂිකර්මය, කර්මාන්ත ආදිය ගොඩනගමින්, වෙළහෙළ දාම දියුණු කරලමින් සංචාරක ව්‍යාපාර වැනි නව මං වලට යොමුකරලීම ආදිය තුළින් ඒ ප්‍රදේශවල ජනතාවට නව ආදායම් මාර්ග සැපයීමට මග සැලැස්විය යුතුය. මේවාටම සම්බන්ධව ඇති පරපාලන, සමාජ, දේශපාලන අංශ ද ක්‍රියාකාරී කළ යුතුව ඇත. මේ ප්‍රදේශවල ජනතාව බොහෝ කාලයකින් හරිහැටි නිදහස් ඡන්දයකටවත් සහ භාගී වී නැත. ඡන්දය පාවිච්චිකර නැත. ජන සංගණන නිදහස් ලෙස පවත්වා මේවාට පසුබිම සැලසිය යුතුය.


4 වන පිටුව බලන්න


ක පා උක් පඳුරු වෙහෙසී මුළු දවස
හ පා දණ්ඩ බී යුෂ නිවමින් පවස
නොපා විඩා දැක නුඹ හිනැහෙන විලස
එ පා නොවේ මට හෙළබිම කිසි දවස

Toiling in the farm all day long cutting sugar-cane
To quench thirst chew the stem for a bit of sap you gain
Weary to the extreme, yet a smile rushes in to your face
This is the reason why I adore the land of my birth place

♦ දයා ආනන්ද රණසිංහ ♦ *Daya Ananda Ranasinghe*

ලංකාවිත්ති වෙබ් අඩවිය Lanka Viththi Website
http://www. lankaheritage.com/lankaviththi/




ඔබේ මුදල් අදම යවන්න අදම ලබාගන්න
FAST CASH
SEND TODAY - COLLECT TODAY
විස්තර පිටු අංක 3